
# රිළා පැංචාට තෑග්ගක්



සුලක්ඛනා තෙන්නකෝන්

කෘතියේ නම - රිළා පැංචාට තෑග්ගක්

කතෘගේ නම - සුලක්ඛනා තෙන්නකෝන්

ISBN අංකය - 978-624-206-839-8

කෘතිය පළ කළ දිනය - 2023.12.01

කතෘගේ වෙනත් කෘති - මාළුවා හා ධීවරයා (2020)

# පිදුම

මෙම පොත සෑදීමට

මා හට නිරතුරුවම උපදෙස්

ලබා දුන්

මා දිරිමත් කළ

මාගේ දෙමාපියන්ටත්

මාගේ පන්ති භාර

ගුරුතුමියටත්

මෙම පොත

ඉතා ආදරයෙන් පිළිගන්වමි.

සුලක්ඛනා තෙන්නකෝන්

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාජෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01



එකමත් එක කාලයක ලස්සන වනාන්තරයක මී අඹ ගසක් තිබුණා. මෙම ගසේ රිළවෙක් වාසය කළා. දවසක් මේ රිළවා අත්තක් උඩ නිදාගෙන ඉන්න විට කල්පනා කළා අනෙක් සෑම සතෙකුටම අම්මෙක් තාත්තෙක් ඉන්නවා. ඔවුන්ට පවුලක් කියලා තියනවා. මට එහෙම කවුරුත් නෑ. හරියට ඉන්න තැනක්වත් නෑ.



මම වැස්සට තෙමෙනවා අව්වට වේලෙනවා මගේ අම්මා කවුද? තාත්තා කවුරුන්ද? කියලා මාව මේ වනාන්තරයට ආවේ කොහොමද? මාව බිහිවුණේ කොහොමද? මගේ අම්මා තාත්තා කොහේද ? ඔවුන් කවුරුන්ද ? කියලා දන්නේ නෑනේ. පසුදින උදෑසනින් අවදි වී තමාගේ දෙමව්පියන් ගැන සොයා බලන්න කියලා රිළා පැටියා පිටත් වුණා. නොදැනීම ගොඩාක් වෙලා ගිහින් ඉර බැසගොස් අඳුර වැටිමට ආසන්න වුණා.



තමන් සිටි ගස තිබෙන තැනට යන්නත් බෑ. රෑ බෝවෙන්නත් ළඟයි. හිතටත් බයයි. අත්තෙන් අත්තට පැන පැන ඉන්න තැනක් බැලුවා. කන්නත් මොනවත් නෑ. එක විටම රිළවා දැක්කා දිය පහරක් ගලාගෙන යනවා. එතනට ගොස් බඩ පිරෙන්න වතුර බීගෙන බීගෙන ගියා. වතුර බීලා බලන විට එතන ගුහාවක් තියනවා දැක්කා.



මෙතන අද රාත්‍රිය ගතකරන්න හොඳයි කියා සිතා නවතින්න තීරණය කර ගත්තා. ගල් ගුහාව තුළට ගිය රිළවාට මහන්සිය නිසා හොඳටම නින්ද ගියා. පසුදා උදෑසන අවදි වූ රිළවා දැක්ක දෙයින් ඇස් අදහාගත නොහැකිව බයින් වෙවුලන්න ගත්තා.




**භයානක කොටියෙක් රිළවා අසල සිටගෙන සිටියා. රිළවා බයෙන් වෙවුලමින් ගුහාවේ මුල්ලකට වී සැඟවී සිටියා. ඉවසාගත නොහැකිව බඩගිනි වී සිටි රිළවාට කෑමට යමක් සොයා ගැනිමට  ගුහාවෙන් එළියට යාමට නොහැකිව කොටියා ගුහාවේ දොර ළඟ නිදාගෙන සිටින නිසා රිළවා ගුහාවේ මුල්ලකට වි ගුළිවී සිටියා.**



කොටියා නිදාගෙන සිටි තැනින් අවදි වී ගොරවමින් ගුහාව තුළට පැමිණ රිළවා සිටි තැනට  ආවා. රිළවා සිතුවා අද නම් මගේ ජීවිතයේ අවසාන දවස බව සිතා ඇස් දෙක  වසාගෙන ගුහාවේ කොනකට තව තවත් ගුලිවී සිටියා. කොටියා කිසි අනතුරක් නොකර බලාගෙන සිට, නැවතත් නිදාගත්තා.



රිළවා හෙමින් හෙමින් කොටියාට ළංවී බැලුවා. කොටියාගේ ඇස් දෙකම පෙනෙන්නේ නෑ. ඒක නිසයි ගුහාව තුළට වී සිටින්නේ. රිළවා වහ වහා ගුහාවෙන් එළියට පැන ගත්තා. ඒත් එක්කම රිළා පැටියා දැක්කා ගසින් ගසට පැන පැන යන රිළා රංචුවක්.



මේ රිළා පැටියාද ඉක්මනට ගස උඩට පැනගෙන රංචුව සිටි දෙසට පැනගෙන ගියා. එම රැලේ හිටපු ලොකු රිළව් දෙන්නෙක් බලාගෙන සිට තමා දෙසට පැනගෙන ඇවිත් මෙම රිළා පැටියා බදා ගත්තා. පැටියා කියමින් අනෙක් රිළවුන්ට ඇසෙන ලෙස හඬ නගමින් කෑ ගැසුවා.



මෙන්න අපේ නැති වුණ චූටි රිළා පැටියාට හරි සතුටුයි. අම්මයි තාත්තයි ලැබුණ නිසා රිලා රංචුවම සතුටින් කෑ ගසමින් සතුටු වුණා. රිළා පැටියාට  යාලුවෝ ගොඩාක් ලැබුණා. දැන් රිළා පැටියාට යාලුවෝ වගේම මල්ලියෙකුත් සිටියා. ඔවුන් ඉතා සතුටින් එම කැළයේ කිසිම කරදරයකින් තොරව ජීවත් වුණා.

නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට

පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01